# ප්‍රවෘත්ති නිවේදනය
# PRESS RELEASE

සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health

Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

**2021.10.06**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී /ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

**<u>මෙරට කොවිඩ් ප්‍රතිකාර සේවාවන් ශක්තිමත් කිරීමට ස්විට්සර්ලන්තයෙන් වෛද්‍ය උපකරණ පරිත්‍යාගයක්.</u>**

වත්මන් රජය සහ සෞඛ්‍ය අංශ විසින් මෙරට කොවිඩ් ප්‍රතිකාර සේවාවන් ශක්තිමත් කිරීම සඳහා ගෙනයනු ලබන වැඩපිළිවෙල ශක්තිමත් කරමින් ස්විට්සර්ලන්තයේ Swiss Medical Technology සහ Aero Lines Zurich GmbH & Operation Center යන ආයතන දෙක විසින් රුපියල් ලක්ෂ 66 ක් පමණ වටිනා අත්‍යාවශ්‍ය සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ සහ වෛද්‍ය උපකරණ තොගයක් අද (06) සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පරිත්‍යාග කෙරිණි.

එම උපකරණ තොගය වෛද්‍ය සැපයීම් අංශයේදී නිල වශයෙන් සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා වෙත මෙරට හෝටල් හිමියන්ගේ සංගමයේ සභාපති සනත් උක්වත්ත මහතා විසින් පරිත්‍යාග කරනු ලැබීය.

මෙම අත්‍යාවශ්‍ය වෛද්‍ය උපකරණ අතර ශල්‍ය මුව ආවරණ (Surgical Masks) 152000 ක්, පුද්ගලික ආරක්ෂිත ඇඳුම් (PPE Kit), ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල (Antigen Test Kit) 471, නවීන තාක්ෂණික ස්වයංක්‍රීය අත්සේදුම්කාරක දියර යන්ත්‍ර 16 ක් ද විය.

මෙම ප්‍රදානයන් මෙරට සෞඛ්‍ය සේවාව වෙත ලබාදීම පිළිබඳව සිය ස්තූතිය පුද කළ සෞඛ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා කියා සිටියේ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙරට සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීමට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පරිත්‍යාගයන් රැසක් ලැබී ඇති බවත්, එම හේතුවෙන් වෛරසය පාලනය හා මැඩපැවැත්වීම සඳහා රජය ගෙනයනු ලබන වැඩපිළිවෙල ශක්තිමත් වීමට හේතු වී ඇති බවයි. මෙම වෛද්‍ය උපකරණ කඩිනමින් කොවිඩ් ප්‍රතිකාර සේවාවන් ලබාදෙනු ලබන රෝහල් වෙත ලබාදීමට කටයුතු කරන බව ද සෞඛ්‍ය අමාත්‍යවරයා වැඩිදුරටත් පැවැසීය.

හොටල් හිමියන්ගේ සංගමයේ හෝටල් 50 ක් පමණ මෙරට කොවිඩ් ප්‍රතිකාර සේවාවන් ශක්තිමත් කිරීම වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වයෙන් කොවිඩ් ප්‍රතිකාර ඇඳන් 5000 ක් මීට ඉහත දී ලබාදී ඇති අතර, එම ප්‍රදානයන් පිළිබඳව පැහැදීමට පත්වූ ස්විට්සර්ලන්තයේ ආයතන දෙකක් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබාදීමට මෙම ප්‍රදානය සිදු කොට ඇත. ඉදිරියටත් මෙරට කොවිඩ් ප්‍රතිකාර සේවාවන් ශක්තිමත් කිරීම සඳහා Swiss Medical Technology සහ Aero Lines Zurich GmbH & Operation Center යන ආයතන දෙක සහයෝගය ලබාදීමට අදහස් කරන බව ද මෙරට හොටල් හිමියන්ගේ සංගමයේ සභාපති සනත් උක්වත්ත මහතා ප්‍රකාශ කළේය.

මෙම අවස්ථාවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය කපිල වික්‍රමනායක, පරිත්‍යාග සම්බන්ධීකාරක රසමාණික්කම් යන මහත්වරු ඇතුලු පිරිසක් එක්ව සිටියහ.

ඉන්දික පොල්කොටුව
ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
0714161168 / 0777270026
සෞඛ්‍ය අමාත්‍යාංශය